**කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී හතරවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය -2017/2018**

# PSC -4279 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදය පිළිබඳ උසස් අධ්‍යයනය

**කාලය : පැ දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට (03)** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20).**

---

01. (අ) ව්‍යවස්ථානුකූලවාදය යනු කුමක් ද?

(ආ) ලිබරල් ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවාදයේ මූලික මූලධර්ම **දෙකක්** සාකච්ඡා කරන්න.

(ඇ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදයේ අර්බුදයක් ඇතැයි පැවසීම නිවැරදි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

02. (අ) බහු සංස්කෘතිකවාදී ආණ්ඩුක්‍රමව්‍යවස්ථාවාදයේ මූලික ලක්ෂණ මොනවා ද?

(ආ) නූතන ජාතික රාජ්‍යයන් හි බහු සංස්කෘතික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාගත කිරීමේදී මතුවන අභියෝග මොනවා ද ?

03. (අ) පුරවැසිභාවය යන්න නිර්වචනය කරන්න.

(ආ) පූර්ණ පුරවැසි අයිතිවාසිකම් සහතික කිරීම සඳහා නෛතික පුරවැසිභාවය පමණක් ප්‍රමාණවත් නොවන්නේ ඇයි ?

04. (අ) වාර්ගික සුළුතර ප්‍රජාව ඉදිරිපත් කරන ස්වයං-තීරණ ඉල්ලීම්වල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ඇඟවීම් මොනවා දැයි සාකච්ඡා කරන්න.

(ආ) සුලුජන ප්‍රජාවන්ගේ ස්වයං-තීරණ අයිතීන් පිළිබඳ ඉල්ලීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ගත කිරීම ශ්‍රී ලංකාවේ දිගින් දිගටම දුෂ්කර වී තිබෙන්නේ ඇයි ?

05. (අ) මහාසන්ධානවාදී ප්‍රජාතන්ත්‍රවාදය යන්න නිර්වචනය කරන්න.

(ආ) වර්තමාන ශ්‍රී ලංකාවට කෙතරම් දුරට මහාසන්ධානවාදී ප්‍රජාතන්ත්‍රවාදී මාදිලිය අදාළ වන්නේ ද?

06. ජනරජවාදී ආණ්ඩුක්‍රමව්‍යවස්ථා ආකෘතිය පිළිබඳව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

( අ. පි. බ. )

07. පහත සඳහන් මාතෘකා වලින් **දෙකක් (02)** පිළිබඳ සටහන් ලියන්න.

**(අ)** නේපාලයේ ආණ්ඩුක්‍රමව්‍යවස්ථා අර්බුදය

**(ආ)** සාමූහික ප්‍රජාතන්ත්‍රවාදය (Deliberative Democracy)

**(ඇ)** වාර්ගිකත්ව වෙන්දේසිය ( Ehtnic Outbidding)

**(ඈ)** ගැඹුරටම බෙදී ගිය සමාජ. (Deeply Divided Societies)

*********************